

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

7 ශ්‍රේණිය

3 පාඩම

භූගෝල විද්‍යාව

M.R.M මාහර

කෑ/දෙහි/ මියනවිට ක වි.

දැරණියගල

ශ්‍රී ලංකාවේ භූ දර්ශන

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයට අයත් දූපතකි.
- මෙහි වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 65,610 ක් වේ.
- මෙම භූමි ප්‍රදේශය තුළ විවිධ භෞතික සහ මානුෂ ලක්ෂණ දැකගත හැකිය.



ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය භූ දර්ශනයේ විවිධත්වය

- ❖ කඳුකර භූ දර්ශනය
- ❖ වෙරළ තීරය ආශ්‍රිත භූ දර්ශනය
- ❖ වියළි කලාපීය භූ දර්ශනය
- ❖ තෙත් කලාපීය භූ දර්ශනය
- ❖ යාපනය අර්ධද්වීපය ආශ්‍රිත භූ දර්ශනය

1.කඳුකර භූ දර්ශනය

- මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් යුක්ත බිම්වල කඳුකර භූ දර්ශනයක් දැකිය හැකිය.

- ලංකාවේ මධ්‍යම කඳුකරයේ ද සබරගමු කඳුකරයේ ද මෙවැනි භූ දර්ශන ඇත.

කඳුවැටි

1. නකල්ස්
2. පිදුරුතලාගල
3. සමනල
4. රාගල
5. නමුණුකුල
6. දොළොස්බාගේ
7. කිරිගල්පොත්ත
8. තොටපොළ



මුදුන් කිහිපයක් ඇත . විවිධ උසින් යුතු වේ. බෑවුම් සහිතය.

නකල්ස් කඳුවැටිය

පිදුරුතලාගල

සානු

1. මහනුවර සානුව
2. හැටන් සානුව
3. වැලිමඩ සානුව
4. හෝර්ටන්තැන්න
5. කොස්ලන්ද සානුව
6. මහවලතැන්න සානුව



උස් භූමියක පිහිටි තැනිතලා ප්‍රදේශයක් සානුවක් ලෙස හඳුන්වයි.

හෝර්ටන් තැන්න

දියඇලි

1. ලක්ෂපාන
2. ඩෙවොන්
3. දුන්හිඳ
4. දියළුම
5. රාවනා
6. බඹරකන්ද (ලංකාවේ උසම දිය ඇල්ල)

කඳුවැටි , සානු හා උස් කඳු මුදුන්වලින් දියඇලි ගලා බසියි.

බඹරකන්ද

දුන්හිඳ

දුර්ග

1. ගම්පොල
2. හැටන්
3. වැලිමඩ
4. ඇල්ල
5. බලන
6. ගලගෙදර

ගමනාගමනයට අපහසු කපොලු සහ වංගු වලින් ගහන ප්‍රදේශ දුර්ග ලෙස හඳුන්වයි

කඳුකර භූ දර්ශනයේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණ

- ✓ කඳුවැටි , සානු , දුර්ග , දියඇලි
- ✓ භූවිෂමතාවට සහ දේශගුණයට අනුව වැඩුණු වෘක්ෂලතා

▶ වංගු සහිත මාර්ග ජාලය



කඳුකර භූ දර්ශනයේ දක්නට ලැබෙන මානුෂ ක්‍රියාකාරකම්

- තේ වගාව , ඒ හා බැඳුණු කම්කරු නිවාස , තේ කම්හල් , දියුණු මාර්ග පද්ධති

- වාණිජ පදනමින් කරන එළවලු වගාව , පලතුරු සහ මල් වගාව
- සත්ත්ව පාලන ගොවිබිම්

සංචාරක කර්මාන්තය හා ඒ හා බැඳුණු හෝටල් , සංචාරක බංගලා

කඳුකරයේ මානුෂ ක්‍රියාකාරකම් සඳහා භෞතික සාධක බලපාන අයුරු

මානුෂ ක්‍රියා	භෞතික සාධක
▪ සංචාරක කර්මාන්තය	දියඇලි , කඳුවැටි
▪ සත්ත්ව පාලනය	පැතිරුණ තෘණ භූමි , සිසිල් දේශගුණය
▪ තේ වගාව	බෑවුම් ප්‍රදේශ
▪ මල් වගාව , එළවලු වගාව	හිතකර, සිසිල් දේශගුණය

පිළිතුරු සපයන්න

පහත වගු සම්පූර්ණ කරන්න.

01.

කඳුවැටි	සානු	දියඇලි	දුර්ග

02.

කඳුකර භූ දර්ශනයේ දැකිය හැකි භෞතික ලක්ෂණ	මානුෂ ක්‍රියාකාරකම්

03. කඳුකරයේ දර්ශනයක් චිත්‍රයට නගන්න.

04. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරය දැක්වෙන සිතියමක කඳු , සානු , දියඇලි, දුර්ග 2 බැගින් නම් කරන්න

වියළි කලාපීය භූ දර්ශනය

- ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය ආරම්භ වූ ප්‍රදේශයයි.
- උතුර , උතුරු මැද , නැගෙනහිර සහ ගිනිකොන දිග ප්‍රදේශවල වියළි කලාපීය භූ දර්ශනය දැකිය හැකිය.
- දැඩි නියඟය , අධික උෂ්ණත්වය , අවිනිශ්චිත හා අඩු වර්ෂාපතනය , ඉහළ වශ්පිකරණය යන සාධක මත මෙම භූ දර්ශනය සැකසී ඇත.



ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය

වියළි කලාපීය භූ දර්ශනයේ භෞතික ලක්ෂණ	වියළි කලාපීය භූ දර්ශනයේ මානුෂ ලක්ෂණ
▪ පුළුල් තැනිතලා ▪ ශේෂ කඳු (කතරගම , සීගිරිය , රිටිගල) ▪ ඍතුමය ගංගා (වර්ෂයේ එක කාලයක දී ගලන ගංගා) ▪ උස් කඳන් , තද අරටු සහිත ගස් වලින් යුතු වනාන්තර ▪ වනෝද්‍යාන (සෝමාවතී, මාදුරුඔය , වස්ගමුව)	❑ වැව් ❑ වී වගාව ❑ සහල් මෝල් , සහල් පිටි ආශ්‍රිත කර්මාන්ත ❑ මඩ ඉඩම් හා ගොඩ ඉඩම් වගාව ❑ හේන් වගාව ❑ අභයභූමි (කුමන, යාල , විල්පත්තුව)
▪ කටු පඳුරු / ලඳු කැලෑ	❑ ආගමික සිද්ධස්ථාන (ශ්‍රී මහා බෝධිය , මඩු පල්ලිය , කතරගම දේවාලය , කොනේශ්වරම් කෝවිල)

භෞතික ලක්ෂණ

ශේෂ කඳු



මානුෂ ලක්ෂණ

හෙන්වගා බිමක්

පිළිතුරු සපයන්න

1. වියළි කලාපයේ දක්නට ලැබෙන භෞතික හා මානුෂ ලක්ෂණ වගුගත කරන්න.
2. වියළි කලාපයේ ජනයා වගා කටයුතු සඳහා ජලය ලබා ගන්නේ කෙසේද ?
3. වියළි කලාපයේ ඇති වැව් 5ක් ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
4. ලංකා සිතියමක වියළි කලාපය ඇඳ දක්වන්න.

තෙත් කලාපීය භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ නිරිත සහ බටහිර ප්‍රදේශ , මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම්වල තෙත් කලාපීය භූ දර්ශනයක් දැකිය හැකිය.

දිනපතා එහා මෙහා යන ජනයා , රථවාහන මෙන්ම සේවා කටයුතු මගින් නිර්මාණය වී ඇති සජීවී බව මේ කලාපයේ විශේෂ ලක්ෂණයකි.



ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය භූ දර්ශනය

භෞතික ලක්ෂණ	මානුෂ ලක්ෂණ
➢ තැනිතලා , හෙල්වැටි ➢ ගංගා , වගුරු බිම් ➢ සාරවත් වෘක්ෂලතා වැස්ම ➢ අධික වර්ෂාපතනය (නායයෑම් / ජල ගැලීම්) ➢ පිටාර තැනි	❖ සාරවත් ගොවිබිම් ❖ එළවළු හා කොරටු වගාව - කැළණි ගඟේ පිටාර තැනිවල ❖ වෙරළාශ්‍රිත - පොල් වගාව ❖ ගංගා නිම්න - වී වගාව ❖ කඳු බෑවුම් - තේ , රබර් ❖ නිදහස් වෙළෙඳ කලාප - කටුනායක , බියගම , කොග්ගල ❖ කාර්මික ජනපද - රත්මලාන , ඒකල ❖ රෝහල් , පාසල් , බැංකු , උසාවි ❖ සංවර්ධිත මාර්ග පද්ධති, අධිවේගී මාර්ග ❖ සැලසුම් සහගත නගර , වාණිජ නගරය පිහිටීම , පරිපාලන අගනගරය

භෞතික ලක්ෂණ

සාරවත් වෘක්ෂලතා වැස්ම

වගුරුබිමක්

මානුෂ ලක්ෂණ

කොළඹ නගරය

ඇඟලුම් කම්හලක්

තෙත් කලාපය තුළ දැකිය හැකි පාරිසරික ගැටළු

- මැටි කැපීම හා මැණික් ඉල්ලම් අසීමිතව හැරීම .
- වන විනාශය.
- නායයෑම්
- භූගත ජල උල්පත් සිඳීයාම.
- මැසි මදුරුවන් බෝවීම.
- ගොඩනැගිලි ගිලා බැසීම.

පිළිතුරු සපයන්න

1. ශ්‍රී ලංකා ආකෘති සිතියමක තෙත් කලාපය වෙන් කර දක්වන්න
2. තෙත් කලාපයේ දැකිය හැකි භෞතික හා මානුෂ ලක්ෂණ වගු ගත කරන්න.
3. තෙත් කලාපයේ සජීවී හා ගතික භූ දර්ශනයක් ඇතිවීමට බලපා ඇති හේතු මොනවාද ?
4. පහත නගර ලංකා සිතියමක ලකුණු කර නම්කරන්න.

   කොළඹ, ගම්පහ, කළුතර,ගාල්ල,මාතර, මහනුවර , කටුනායක, කොග්ගල, බියගම

5. තෙත් කලාපයේ භූ දර්ශනයට අදාළ පින්තූර කිහිපයක් දක්වන්න.

යාපනය අර්ධද්වීපය හා යාබද දුපත් ආශ්‍රිත භූ දර්ශනය

- ශ්‍රී ලංකාවේ උතුරින් යාපන අර්ධද්වීපය හා ඒ ආශ්‍රිත ව ඩෙල්ෆ්ට් , කයිට්ස්, නාගදීපය වැනි දුපත් කිහිපයක් පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනය

භෞතික ලක්ෂණ	මානුෂ ලක්ෂණ
▪ තැනිතලා බිම්, කලපු , ▪ දුපත් (ඩෙල්ෆ්ට් , කයිට්ස් , නාගදීපය) ▪ වැලිතලා , හුණුගල් පස ▪ භූගත ලක්ෂණ ▪ අඩු වර්ෂාපතනය ▪ අධික උෂ්ණත්වය ▪ අධික වාෂ්පීකරණය ▪ අලංකාර වෙරළ තීරය	▪ අර්තාපල් , මිරිස් , රතුළුණු , බීට් , මිදී , අඹ, කෙසෙල් වගාව ▪ ධීවර කර්මාන්තය ▪ ලුණු නිපදවීම ▪ හස්ත කර්මාන්තය ▪ තල් ආශ්‍රිත නිෂ්පාදන ▪ හින්දු ආගම මත ගොඩනැඟුණු කෝවිල් , ආගමික උත්සව , පෙරහැර

ඩෙල්ෆ්ට් දූපත

මන්නාරම් දූපත

නාගදීප විහාරය

තල් ආශ්‍රිත නිෂ්පාදන

- තල් පිටි
- තල් හකුරු
- කොට්ටකිලංගු
- තල් පැණි
- තල් සීනි

තල් ගස

තල් හකුරු

තල් කොළ ආශ්‍රිත නිෂ්පාදන

පිළිතුරු සපයන්න

1. යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භෞතික ලක්ෂණ හා මානුෂ ක්‍රියාකාරකම් වගු ගත කරන්න.
2. පහත ස්ථාන ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.

   කයිට්ස් දූපත , ඩෙල්ෆ්ට්, නාගදීපය, නල්ලූර් කෝවිල, එලිෆන්ට්පාස්ට් ලුණු ලේවාය

3. තල් ගසෙන් ලබාගන්නා ප්‍රයෝජන දක්වන්න.
4. මෙම භූ දර්ශන ප්‍රදේශය ලංකා සිතියමක වෙන් කර දක්වන්න.

වෙරළාශ්‍රිත භූ දර්ශනය

ශ්‍රී ලංකාව වටා ඇති දූපත් ,බොකු , කලපු ,තුඩු , වගුරු වැනි භූ ලක්ෂණවලින් සමන්විත වෙරළ තීරය තුළ ඊටම ආවේණික භූ දර්ශනයක් තිබේ.

ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

භෞතික ලක්ෂණ	මානුෂ ලක්ෂණ
▪ වෙරළ තීර (හම්බන්තොට , පාසිකුඩා , උණවටුන , අරුගම්බේ , හික්කඩුව) ▪ කලපු , බොකු , තුඩු , දූපත් ▪ කොරල්පර ▪ කඩොලාන ශාක පද්ධති ▪ දර්ශනීය වැලි තලා (නිලාවේලි)	✓ හෝටල් , සංචාරක නිකේතන ✓ පුරාවිද්‍යාත්මක ස්ථාන ✓ ප්‍රදීපාගාර ✓ ආගමික සිද්ධස්ථාන ✓ විනෝද නිකේතන ✓ ධීවර කර්මාන්තය ✓ ධීවර ජනාවාස ✓ කරවල වේලීම ✓ හුණුගල් කර්මාන්තය ✓ කොහු ආශ්‍රිත නිෂ්පාදන

වෙරළාශ්‍රිත භෞතික ලක්ෂණ

මුහුදු කුළු

RMH.Devinda:(BA:Sp)Geography;Uni of Ruhuna

හුම්මානය

RMH.Devinda:(BA:Sp)Geography;Uni of Ruhuna

මුහුදු තුඩුව

මුහුදු බොක්ක

RMH.Devinda:(BA:Sp)Geography;Uni of Ruhuna

වෙරළාශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම්

වෙරළ භූ දර්ශනයට හානිවන අවස්ථා

- හිරිගල් කැඩීම
- වෙරළින් වැලි ඉවත් කිරීම
- කඩොලාන ඉවත්කිරීම
- කැළිකසල බැහැර කිරීම

පිළිතුරු සපයන්න

1. වෙරළාශ්‍රිත භූ දර්ශනයේ දක්නට ලැබෙන මානව ක්‍රියාකාරකම් නම් කරන්න.
2. ශ්‍රී ලංකා සිතියකම බොකු, කලපු, දූපත් 3 බැගින් නම් කරන්න.
3. වෙරළාශ්‍රිත නගර කිහිපයක් ද ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
4. ඔබ ජීවත්වන ප්‍රදේශයේ දක්නට ලැබෙන භෞතික හා මානුෂ ලක්ෂණ මොනවාද?